**බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - අමාත්‍ය කාර්යාලය**

Gj;jrhrd rka kw;Wk;  fyhrhu mYty;fs; mikr;R - அமைச்சரின் அலுவலகம்

Ministry of Buddhasasana, Religious and Cultural affairs – Minister's Office

8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව     8Mk; khb, nrj;rpwpgha> gj;juKy;iy> = yq;fh     8th floor, Sethsiripaya, Battaramulla, Sri Lanka


මගේ අංකය / vdJ ,y / My No. — BRC/MO/35/55

ඔබේ අංකය / ckJ ,y / Your No. —

දිනය / jpfjp / Date . — 2025.05.10

## බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ වෙසක් දින පණිවුඩය

ශ්‍රී බුද්ධ වර්ෂ 2569 වැන්නෙහි යෙදෙන මෙවර වෙසක් මහෝත්සවය "හපෙථ මිත්තේ කල්‍යාණෙ - හපෙථ පුරිසුත්තමේ" හෙවත් "කලණ ගුණ ඇති උතුම් මිතුරන් ඇසුරු කරමු" යන්න තේමා පාඨය කර ගනිමින් සැමරීමට නියමිත ය.

බෝධිසත්වයන් වහන්සේ මතු බුදු බව පතා ප්‍රථම වරට නියත විවරණ ලැබීම, සිද්ධාර්ථ බෝසත් කුමරු ඉපදීම, සිදුහත් කුමරුන් බුදුවීම, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑම, බුද්ධත්වයෙන් පසුව කිඹුල්වත් පුරට වැඩමවීම සහ යමා මහ පෙළහර පෑම, බුදුරජාණන් වහන්සේගේ තුන්වන ලංකාගමනය වූ කැලණියට වැඩම කිරීම සහ එදින ම සමනල කන්දේ සිරිපා සටහන තැබීම යන සුවිශේෂී අවස්ථා සිහිපත් කරමින්, බුදුරජාණන් වහන්සේ ව ආමිස හා ප්‍රතිපත්ති පූජාදියෙන් පුදමින් බෞද්ධයෝ වෙසක් දිනය සමරන්නාහ.

බුදුන්වහන්සේ විසින් දේශනා කරන ලද උතුම් සද්ධර්මය පිළිබඳ ගැඹුරින් අධ්‍යනය කිරීම, විමසීම උන්වහන්සේට කරන අනඟි ම පූජාව යි. එම ප්‍රතිපත්තිමය පූජාව ප්‍රමුඛ කර ගත් වෙසක් මහෝත්සවය වූ කලී අපගේ ආකල්පමය වෙනසක් සඳහා වූ සුදුසු ම හැරවුමකි; ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැංවීම සඳහා සංහිඳියාවේ සංකේතයක් බඳුව ක්‍රියාකරන්නකි; කලාවේ හා සංස්කෘතියේ පුනර්ජීවනයට හේතුවන්නකි; නව සංස්කෘතිකාංග ශ්‍රී ලාංකේය සංස්කෘතියට එකතු කරන්නකි. මෙබඳු වැදගත්කමකින් යුත් සංස්කෘතික මංගල්‍යයක් වන "වෙසක් දිනය" සඳහා හද පිරි සුභාසිංසනය මින් පළ කරමි.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" සැමට උදා කිරීමට යන මේ ගමනේ දී සදාචාර සම්පන්න, පෞරුෂවත්, සංවේදී, මනුෂ්‍යත්වයෙන් හෙබි පුද්ගලයෙක් බිහිකිරීම සඳහා අවශ්‍ය වන ආධ්‍යාත්මික වශයෙන් යහපත් හා ශක්තිමත් වාතාවරණයක් ඇති කර ගැනීමට මෙම වෙසක් දින හැරවුම් ලක්ෂ්‍යයක් ම වේවායි පතමි.

තෙරුවන් සරණයි!

ශාසනාලයෙනි,
මේ වගට,



ආචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි,
බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය.


දුරකථන අංකය / njhiyNgrp ,y / Telephone No — අමාත්‍ය / mikr;ru; / Minister: 011- 2861147 — ලේකම් / nrayhsu; / Secretary: 011-2861108 — කාර්යාලය / mYtyfk; / Office: 011-2872001, 011-2876586, 011-

ඊමේල් / kpd;dQ;ry; / E mail: culturalmin@gmail.com

වෙබ් අඩවිය / ,izaj;jsk; / Web site: www.cultural.gov.lk